## අද ඇරඹෙන අලුත්ම නවකතාව

උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ



මම වීදුරු බිත්තිය අසල නතර වී පිටත ඇදහැලෙන වර්ෂාව දෙස නිසොල්මනේ බලා සිටියෙමිඃ සවිමත් වීදුරු බිත්ති වල වැදී සිමෙන්ති පොළවට වැටෙන විශාල වැහි බිංදු බිම පුරා වේගයෙන් පැතිර ගියේ මනස්කාන්ත රටාවක් මවමිනි. අවසානයේ දිය කඳ සියල්ල සෝදා ගෙන ගොස් කෙළවරක ඇති සිදුරෙන් පහත විශාල කානුවට එකතු විය. ඇතැමුන් වැස්ස නොතකා තම කටයුත්ත වෙනුවෙන් පේව්මන්ට් ඔස්සේ වේගයෙන් ඇවිද ගියත් ස්වල්ප දෙනෙක් කෝපි තොල ගාමින් දොඩමලු වී සිටියහ.

මම මගේ ශීත කබාය ඉදිරිපස විවරව තිබූ රිදී බොත්තම් කිහිපය පියවාගෙන හිස්වැසුම සකස් කර ගතිමි. රථගාලෙන් එපිටට වන්නට නවතා තිබූ වාහන කිහිපය දෙස යළිත් හිස හරවා බැලූ මම කඩිනම් ගමනින් වැහිබිඳු අතරින් ඇවිද ගියෙමි. එසැනින්ම රථගාලට හැරවූ මෝටර් රථයේ නොහැපී මා බේරුණේ යන්තමිනි. රථයේ රියැදුරා මා දෙස රවා බලන්නට සැරසෙත්ම ඔහු මා හැඳින ගත්තේය. සිව් නෙත් තත්පර කිහිපයක් විශ්මයෙන් ඇලලී තිබුණි. ඒ ඔහුය. සැබැවින්ම ඒ ඔහුය. මගේ අතීතය පුරාවට හමන මිහිර සුවඳ ඔහුය. මගේ අප්‍රකාශිත ප්‍රේමයේ හිමිකරුවා ඔහුය. මටම නොදැනෙන හේතුවක් නිසාවෙන් මම මෙවරද ඔහුගේ බැල්මෙන් පලා ගොස් වේගයෙන් ඉගිල ගියෙමිඃ වසර පහළොවක් ගෙවී ගියත් ඒ බැල්ම පෙර මෙන් කාන්තියෙන් උතුරා යමින් තිබෙනු මම දුටුවෙමි.

ඔහු ඉඳුවර බණ්ඩාරනායක නම් වෙයි. මම දුලිනි විදානපතිරණ වෙමි. ඔහු අදටත් මගේ කිසිවෙකු නොවේ. මම ඔහුගේ කිසිවකුද නොවෙමිඃ ඒත් අපි එකිනෙකා හොඳින් හඳුනන්නෙමු. නමක් නැති බැඳීමක් අප අතර තිබේ.

"මේ ලෝකෙ කලුම කලු චරිත නෑ, සුදුම සුදු චරිත කොහෙත්ම නෑණි තියෙන්නෙ අලු පාට චරිතණී අපි හැමෝම කලු=සුදු චරිත. අපි අලු පාටයි"

ඉඳුවරගේ ''අලු පාට මිනිස්සු '' කෙටි නාට්‍යයේ දෙබසක් මට සිහි වේ. මම ඔහුගේ කව් පංති කොතෙකුත් කියවා ඇත්තෙමි. නාට්‍ය නරඹා ඇත්තෙමි. මම ඔහු හොඳින් හඳුනමි. එහෙත් අප කිසියම් දිනෙක මුණ ගැසී කථා කළ බවට මතකයක් මා වෙත නැතඃ මට ඔහු නුහුරු බැව් සැබෑවක. එහෙත් ඔහුගේ ආත්මය මට වඩාත් හුරුය. අප අතර වන බැඳීමට නමක් දිය නොහැකි බැව් දැන් තවදුරටත් පැහැදිලිය. අඳුරු අතීතය අමතක කිරීමට අනවරථ වෙහෙසක් දරණ මොහොතක අහම්බෙන් හෝ ඔහු හමුවුණේ මන්ද?

මා ගරාජයෙන් ඇතුලු ගෙට පිවිසෙන කුඩා දොර විවර කරත්ම ප්‍රණීත ආහාර සුවඳින් නිවස පිරී තිබුණි. තද ශීතල නිසා ඇවිලෙමින් තිබූ කුසගින්න සිරුර තරමක් අප්‍රාණික කර තිබූ හෙයින් මම මුලුතැන් ගෙයි කුඩා මේසය සමීපයේ වූ පුටුවට බර වුණෙමි.

" පුංචි ඇයි මේ බයවෙලා වගේ මොකද වුණේ" ඒප්‍රනයෙන් දෑත පිහිදමින් මනහාරි මවෙත දුව ආවාය. මම මේසය මත වූ වතුර බෝතලය ගෙන ඉන් අඩක් එක හුස්මට හමාර කළෙමි.

"අනේ ඇයි පුංචි මොකද වුණේ?"

''ඔයා ඔය ආපු ගමන්ද ඇයි කෑම හදන්න ගත්තෙ මං එනකං ඉන්න එපැයි පුතේ''

'' කමක් නෑ හැමදාම පුංචිනෙ ගෙදර වැඩ සේරම කරන්නෙණී මට අද ටිකක් කලින් ලෙක්චර්ස් ඉවරවුණාඃ අද සිකුරාදනෙ මට රෙස්ටොරන්ට් එකට යන්නත් නැහැ නෙ. ඉතිං මං තනියෙන් ෆිෂ් මාර්කට් ගිහිං ඉස්සොත් අරං ආවා.''

ඈ කිරිල්ලියක මෙන් කියවා ගෙන යයි. මම ඒ හුරුබහුටි මුහුණ දෙස දයාවෙන් බලා සිටියෙමිඃ මනහාරි මගේ එකම අක්කාගේ දියණියයි. මේ දුරු රටේ මට සිටින එකම නෑයා ඇයයි.

'' අද මනික් එනවද?''
'' නෑ ඇයි පුංචි එහෙම ඇහුවෙ?''

'' හති දාගෙන උයන නිසා''

ඈ සිනාසුණාය. මගේ අක්කා මෙන්ම හැඩකාර දුවගේ සිනාව මා තුල ගොඩනැගෙමින් තිබූ තිගැස්ම යම්තරමකට තුනී කළේය.

'' ඉස්සර කැම්පස් යන කාලෙත් මං සිකුරාදට ගෙදර දුවං එන්නෙ ඔය හිනාව දකින්න'' මම ඇගේ නිකටෙන් සොලවා කීවෙමි.

''ඉතිං පුංචි තාම කිව්වෙ නෑනෙ හති දාගෙන දුවං ආපු හේතුව''

'' අර මනික් කොල්ලා ගෙට රිංගන්න කලින් මං මේ දුවං ආවෙ''

මම බොරු තරහක් පෙන්වා කථාව මග හැර අසුනෙන් නැගී සිටියෙමි. ඈ මගේ වමතේ අතැඟිලි අල්ලා ගත්තාය.

''බාප්පා කෝල් කලාද? '' ඈ මගේ දෑසට එබුණාය.
''නෑ පුතේ''
''එහෙනං මට කියන්නකො ඉඳුවර අංකල්ගෙ ඇඩ් එකක්වත් දැක්කද කියලා''

මම නිහඬ වුණෙමි.

'' අන්න එයා අපේ යුනිවර්සිටි එකට එනවලු ලබන බදාදා ලලංකාවේ ලමයි මේ පාර ෆිල්ම් ෆෙස්ටිවල් එකක්නෙ කරන්නෙ''

'' මට එයා අද අහම්බෙන් හම්බවුණා පුතේ''

''අයියෝ.. ඊකද මේ බයවෙලා. පුංචි කැම්පස් යන කාලෙත් එයාව දැක්කම දුවනවා ඃතාමත් දුවනවා ඃඇයි පුංචි මේ''

මම දිග සුසුමක් හෙලුවෙමි.

''අපි කමු මට හුඟක් බඩගිනියි''

තරමක් ඈත ට වන්නට තිබූ ශ්‍රීලාංකික වෙළඳ සැලකින් රැගෙන ආ ඉඳිආප්පත් මනහාරි රසට උයා තිබූ ඉස්සො කිරි හොද්දත් මගේ කුසගිනි නිවා දැමුවේය.

00000000

සති අන්තය නිමාවී නැවතත් සඳුදා කාර්යාලයට යාමට පිටත් වුවද සිකුරාදා හැන්දෑවේ සිදුවූ හදිසි හමුව මා තුළ කිසියම් චකිතයක් මතු කළේය. පුරුදු පරිදි කන්තෝරු ඇරී දුම්රියට ගොඩ වෙන විට ඒ චකිතය කැළඹීමක් බවට පත් වී තිබුණි. සීතල දැඩි වෙමින් තිබුණද සිහින් දඩිය බිඳු කිහිපයක් මගේ උඩු තොලට එපිටින් නැගෙනු මට දැනුණි. මම දුම්රියෙන් බැස හනික රථ ගාල හරහා ඇවිද ගොස් මෝටර් රියට නැඟුණෙමි. මේ අවිනිශ්චිත බිය මුසු හැඟීම මා කෙරෙන් පහව යෑමට සති කිහිපයක් වැය විය. ඉඳුවර මේ දක්වා මට මුණ ගැසුණේ නැතත් පීඩාකාරී සිතුවිලි විටින් විට මා අසරණ කළේය. මනහාරී ඉඳුවරගේ විශ්ව විද්‍යාලයට පැමිණීම ගැන හෝ ඔහු එහිදී පැවැත්වූ දේශනය ගැන හෝ කිසිවක් මා සමඟ සඳහන් නොකිරීමට ප්‍රවේශම් වූවාය. මේ අතර ඈට දින පහක අනිවාර්ය සායනික පුහුණුවක් සඳහා බැලරාට් වෙත පිටත්ව යෑමට සිදු විය. කඳුකර පරිසරයට ඔරොත්තු දීම සඳහා අවැසි උණුසුම් කබා සහ පොරෝනා මෙන්ම පාවහන් අඩුක්කු කළ ගමන් මල්ල රථයට පැටවූ ඈ මා තරයේ වැලඳගෙන හාදුවක් දුන්නාය.

"පරිස්සමෙන් වාහනේ එලවන්න පුතේ, ඒ වගේම සීතල ට හොඳට අඳින්න. කන් දෙකයි බෙල්ලයි හොඳට වහගෙන ඉන්න"

"මං ගිය ගමන් පුංචිට කෝල් කරන්නං"

මනහාරී මෙල්බර්න් වෛද්‍ය විද්‍යාලයට ශිෂ්‍යත්ව යක් දිනා මා වෙත අවුත් මේ ගෙවෙන්නේ සිව්වන වසරයි. ඈ මීට පෙරද නිව්සවුත්වේල්සයේ වසරක් පාසා පැවැත්වෙන වෛද්‍ය ශිෂ්‍ය සම්මේලන සඳහා සහභාගී වීමට පිටත්ව ගිය අවස්ථා කිහිපයකි . එබඳු කවර අවස්ථාවකවත් මා වෙත නොපැමිණි කාන්සිය මුසු ශෝකයකින් මෙවර මම පීඩා වින්ඳෙමි. මනහාරී බැලරාට් බලා පිටත්ව ගිය දිනයට දින දෙකකට පමණ පසු එළඹි හැන්දෑවක

කන්තෝරු ඇරී නිවසට පැමිණ දිය නා ගත් පසු මම ඇය වෙනුවෙන් ගොතමින් සිටි අඩක් නිම කළ සීත කබාය අතට ගෙන විසිත්ත කාමරයේ වූ ඇඳි පුටුවට බර වුණෙමි.නිවසේ ප්‍රධාන දොරටුව අභියස වූ කුඩා ඝන්ඨාරය කිසිවකු විසින් නාද කරන්නට විය. ඇතැම්විට ඒ අපේ අසල්වැසි පෝලා විය යුතුය. රුසියානු සුන්දර යුවතිය පිවිසුම අභියස ඇතැයි සිතා මුව පුරා සිනාසී මම දොර විවර කළෙමි.

එහෙත්, පුදුමයකි. දොර ළඟ සිටියේ ඉඳුවර ය. මම දෙනෙත් අයා ඔහු දෙස බලා සිටියෙමි.

"මං ඇතුලට ආවට කමක් නැද්ද" ඔහු ඇසුවේ සැහැල්ලුවෙන් සිනාසීගෙනය. මගෙන් පිළිතුරක් නොලද තැන ඔහු ගෙතුලට වීත් සෝපාවේ ඉඳගත්තේය. ඔහුගේ මෝටර් රථය අපේ ගරාජයේ මනහාරිගේ රථයට අයත්ව තිබූ ඉඩ කඩ අත්පත් කරගෙන සිටියේය. මට නිරායාසයෙන්ම මා දෙස බැලුණි. මා ඇඳ සිටියේ කළු පැහැ සැහැල්ලු කලිසමක් සමඟ සරල උඩු කබායක් පමණකි .මා ඒ මේ අත බැලුවේ පලායන්නට තැනක් සෙවීමටය.

"ඔයත් ඉඳගන්න"

මගේ අපහසුතාව ඔහු ට තේරුම් යන්නට ඇත. මම සෝපාවේ කෙළවරකින් අඩමානයට ඉඳගතිමි. මා ඔහු සමඟ සංවාදයකට එලඹෙන ප්‍රථම අවස්ථාව මෙය විය. විමතිය , චකිතය සහ අපහසුතාවය සම්මිශ්‍ර වූ විකාර හැඟීමකින් මා හීතියට පත් වී සිටි බවක් මට මතකය. මා දෑත් වෙලාගෙන අසුන්ගෙන සිටියේ සන්සුන් වීමට මහත් වෙහෙසක් දරමිනි.ගතවෙන සෑම මොහොතක්ම ඉතා දීර්ඝ වකවානු ලෙස මට දැනුණි. මම නොසන්සුන් මනසින් එහෙත් සන්සුන්ව ඉඳගෙන සිටියෙමි.

"මට ගොඩක් සීතලයි. කරදරයක් නෙමේ නං විතරක් හීටර් එක දාන්න පුළුවන්ද?"

ඔහු ඉතාම පැහැදිලිව කථා කළේය. මම අසුනෙන් නැගිට ගොස් නිවසේ උණුසුම් පද්ධතිය ක්‍රියාත්මක කළෙමි.